# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

### 2024 අගෝස්තු

### සමාජීය විද්‍යා පීඨය

### පුරාවිද්‍යාව

### අභිලේඛන හා නාණක විද්‍යාව: ශ්‍රී ලංකාව හා ඉන්දියාව ARCH 28224

1 හා 2 කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ඇතුළත් වන පරිදි ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

## 1 කොටස

01. (i) අභිලේඛන යනු කුමක්දැයි හඳුන්වා දෙන්න. (ලකුණු 10)

    (ii) වංශකථාවන්හි ඇතුළත් කරුණු සංස්කරණය කරගැනීම සඳහා ශිලාලිපි උපකාරී වන අන්දම උදාහරණ දෙමින් පෙන්වා දෙන්න. (ලකුණු 10)

02. එක්කෝ

    ශ්‍රී ලංකාවේ අක්ෂර කලාවේ ප්‍රභවය පිළිබඳව පුරාවිද්‍යාත්මක සාධක ආශ්‍රයෙන් විස්තර කරන්න. (ලකුණු 20)

    නැතහොත්

    ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මී අක්ෂර රූප විකාශනයෙහි ලා බලපෑ විදේශීය ආභාසයන් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 20)

03. 'සාක්ෂරතාවයට එළඹීම මනුෂ්‍ය පරිණාමයේ තීරණාත්මක සන්ධිස්ථානයකි." අක්ෂර පද්ධති නිර්මාණය කරගැනීම සඳහා බලපෑ පසුබිම කෙරෙහි අවධානය යොමුකරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

04. පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හෙළිකර ගතහැකි සමකාලීන සමාජ-ආර්ථික පසුබිම උදාහරණ සහිතව විග්‍රහ කරන්න. (ලකුණු 20)

## 11 කොටස

05. (i) නාණක විද්‍යාව යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 10)

    (ii) පුරාවිද්‍යාව සඳහා නාණක විද්‍යාව වැදගත්වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

06. ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් සංසරණය වූ කාසි වර්ගය රූප සටහනකින් ඇඳ දක්වා එම කාසි පිළිබඳ ප්‍රාමාණිකාත්මක විස්තරයක් කරන්න. (ලකුණු 20)

07. ලක්ෂ්මී කාසියෙහි නිෂ්පාදිත කාලය, එහි ඇති සංකේත හා ඒ පිළිබඳ ඇති මත කෙරෙහි අවධානය යොමු කරමින් ඒ පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 20)

08. අනුරාධපුර යුගයෙන් පසු කාසිවල දක්නට ලැබෙන සංකේත හා රූප සටහන් පිළිබඳ විග්‍රහයක් කරන්න. (ලකුණු 20)

******************************